Sinhalese

vicTAG
VICTORIAN THERAPEUTICS ADVISORY GROUP

# සැත්කමකට පසු වේදනා ඖෂධ

මේ තොරතුරු ලබාදෙන්නේ සැත්කමකින් පසුව වේදනා සමනය පිනිස දෙන බෙහෙත් වට්ටෝරුව හෝ සපයන ලද ඖෂධ සමග නිකුත් කිරීම සඳහාය. සුවිශේෂ උපදෙස් සඳහා ලේබලය හෝ බෙහෙත් වට්ටෝරුව බලන්න.

## සැත්කමකින් පසුව වේදනාව

සැත්කමකින් පසුව වේදනාව ඇතිවීම ස්වාභාවිකය. සැත්කමකින් පසුව වේදනාව පාලනය කරගැනීමට සහ සමනය කරගැනීම සඳහා බෙහෙත් පාවිච්චි කිරීමට ඔබට අවශ්‍ය විය හැකිය.

මේ බෙහෙත් ඔබේ වේදනාව අඩු කිරීමට සහ වඩා ඉක්මනින් ආපසු ඔබට ඔබේ සාමාන්‍ය වැඩ  කටයුතු වල යෙදීමට උපකාරී වනු ඇත.

## උපකාරී විය හැක්කේ කිනම් බෙහෙත්ද?

ඔබේ සැත්කමෙන් පසුව ඔබට වඩාත් සුදුසු කිනම් වේදනා බෙහෙත්ද යන්න ගැන ඔබේ වෛද්‍යවරයා තීරණය කරනු ඇත. ඔබට ලබාදිය හැකි බෙහෙත් වලට මේවා ඇතුලත් විය හැක:

- පැරසිටමොල් (Paracetamol)
- ප්‍රදාහය වළක්වන බෙහෙත් (ibuprofen or diclofenac)
- Tramadol
- අබිං  වල ආසක්ත ගුණය සහිත බෙහෙත් (Endone®, Oxycontin® or Targin®)

## ඔබේ වේදනා බෙහෙත් පාවිච්චි කළයුතු අන්දම

ඔබේ වේදනා බෙහෙත් නිර්දේශ කර තිබෙන ආකාරයට පාවිච්චි කරන්න. නිර්දේශ කරඇති මාත්‍රාවට වඩා පාවිච්චි නොකරන්න.

ඔබේ වෛද්‍යවරයා  ඔබට උපදෙස් දී ඇත්නම්  වේදනා බෙහෙත්  සංයෝජනයක් පාවිච්චි කරන්න. එමගින්, එක් බෙහෙතක වැඩි මාත්‍රාවක් පාවිච්චි කරනවාට වඩා හොඳින්,  අඩු අතුරු ඵල සහිතව වේදනාව සමනය කරගත හැකිවනු ඇත.

සමහර වේදනා බෙහෙත් නිතිපතා පාවිච්චි කරන ලෙස ඔබේ වෛද්‍යවරයා ඔබට නියම කරනු ඇත. තවත් යම් කිසි බෙහෙතක් ඔබට වැඩි වේදනාවක් දැනෙන විට 'අවශ්‍ය පරිදි' පාවිච්චි කරන ලෙස ඔබේ වෛද්‍යවරයා ඔබට නියම කිරීමට ඉඩ ඇත.

බෙහෙත් මාත්‍රාවක් පාවිච්චි කිරීමට ඔබට අමතක වුනොත්, එම මාත්‍රාව මග හැර, සාමාන්‍ය විදිහට ඊලග මාත්‍රාව පාවිච්චි කරන්න. අමතක වුන මාත්‍රාව පිරිමැසීමට මාත්‍රා දෙකක් පාවිච්චි නොකරන්න.

## අතුරු ඵල

ඔබට ඇතිවිය හැකි සමහරක් අතුරු ඵල අතරට ඔක්කාරය, වමනය, මලබද්ධය සහ නිදිබර ගතිය ඇතුල් වේ. ඔබට නිදිබර ගතිය දැනේ නම් වාහනයක් පැදවීම හෝ යන්ත්‍ර ක්‍රියාවේ යෙදීමෙන් වළකින්න.

## පහත අවස්ථා වලදී ඔබේ වෛද්‍යවරයා අමතන්න:

- ඔබට වේදනාව නිසා නින්දට යාමට නොහැකිනම්
- අඩු වෙනවා වෙනුවට ඔබේ වේදනාව වැඩි වෙනවා නම්
- වේදනාව සමනය සඳහා බෙහෙත් පාවිච්චි කළ පසුව ඔබේ වේදනාව අඩු නොවේ නම්
- වේදනාව සමනය සඳහා බෙහෙත් වලින් ඔබට අතුරු ඵල හටගනී නම්
- ඔබ අහම්බෙන් පමණට වඩා වේදනා බෙහෙත් පාවිච්චි කලා නම්

## වේදනා බෙහෙත් නැවැත්වීම

ඔබ කොපමන කාලයක්  වේදනා බෙහෙත් පාවිච්චි කළ යුතුද යන්න ඔබේ වෛද්‍යවරයාගෙන් අහන්න.

ඔබේ සාමාන්‍ය වේදනා පාලන බෙහෙත් පාවිච්චිය ක්‍රම ක්‍රමයෙන්  නවත්වන්න. ඔබේ වේදනාව අඩුවී,  ඔබේ 'අවශ්‍ය පරිදි' පාවිච්චි කරන බෙහෙත් ගැනීම තවදුරටත් අවශ්‍ය නොවන විට,  ඔබේ සාමාන්‍ය වේදනා පාලන බෙහෙත් පාවිච්චිය ක්‍රම ක්‍රමයෙන්  නවත්වන්න.

## ඉතිරිවුන බෙහෙත්

ඔබේ සැත්කමෙන් ඔබ සම්පූර්ණ සුවය ලැබුවාට පසු, ඉතිරි වේදනා බෙහෙත් සුරක්ෂිතව බැහැර කිරීම පිණිස ඔබේ ප්‍රදේශයේ ඔසුහල වෙත ගෙනියන්න.

වේදනා පාලන බෙහෙත් පාවිච්චි කළ යුත්තේ වෛද්‍ය උපදෙස් මත පමණි. ඔබේ ඥාතීන්ට හෝ මිතුරන්ට ඔබට තිබෙන රෝග ලක්ෂණ තිබුනත්, ඔබේ බෙහෙත් ඔවුන්ට දීමෙන් වළකින්න.

Consumer reviewed
March 2020

English

# Pain medicines after surgery

This information is intended to accompany prescription or supply of medicines for pain relief after surgery. Please refer to prescription or label for specific instructions.

**Pain after surgery**

It is normal to have some pain after surgery. You may need to take some medicines to control and relieve pain after surgery.

These medicines will help with reducing your pain and allowing you to get back to your usual activities more quickly.

**Which medicines can help?**

After your surgery your doctor will assess which pain medicines are most suitable for you. Some of the medicines you might be given include:

- Paracetamol
- Anti-inflammatory medicines (such as ibuprofen or diclofenac)
- Tramadol
- Opioid medicines (such as Endone®, Oxycontin® or Targin®)

**How to take your pain medicines**

Take your pain medicines as directed. Do not take more than the recommended dose.

When advised by your doctor use a combination of pain medicines. This can achieve better pain relief, with fewer side effects, than a large dose of a single medicine.

Some pain medicines will be prescribed for you to take regularly.  You may also be prescribed a medicine to use 'as needed' when you are experiencing more pain.

If you forget to take a dose of medicine, skip that dose and take the next dose as usual. Do not take a double dose to catch up.

**Side effects**

Some of the side effects you may experience include nausea, vomiting, constipation and drowsiness. Do not drive a motor vehicle or operate machinery if you experience drowsiness.

**Contact your local doctor if:**

- you are unable to sleep because of pain
- your pain is increasing rather than improving
- your pain doesn't get better after taking your pain relief medicine
- you are experiencing side effects from your pain relief medicine
- you accidentally take too much pain relief medicine

**Stopping your pain medicines**

Ask your doctor about how long to take your pain medicines.

Stop taking your regular pain control medicines gradually. When your pain has improved and you no longer require your 'as needed' pain relief medicine, you can gradually stop taking your regular pain-relief medicines.

**Leftover medicines**

Once you have fully recovered from your surgery, take any leftover pain medicines to your local pharmacy for safe disposal.

Pain relief medicines should only be taken on medical advice. Do not give your medicines to relatives or friends, even if they have the same symptoms.

Consumer reviewed
March 2020